## කාඩ්පත් හිමියා විසින් කරනු ලබන ප්‍රකාශය

**මෙම ප්‍රකාශය ජාතික සංවර්ධන බැංකුව - පීඑල්සී (NDB බැංකුව) වෙත සිදුකරනු ලැබේ.**

පහත අත්සන් කරනු ලැබීමෙන් මා/අප වෙනුවෙන් ගිණුමක් විවෘත කර කාඩ්පත් නිකුත් කරන ලෙස මා/අප ඉල්ලා සිටින අතර එම කාඩ්පත් දෙකට කපා කැබලි දෙක ඔබ වෙත ඉදිරිපත් කිරීමෙන් එකී කාඩ්පත් භාවිතා කිරීමේ මාගේ/අපගේ අයිතිය පවාරණය කරන තුරු ඒවා අලුත් කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සිදුකරන ලෙසත් මම/අපි ඉල්ලා සිටිමි/සිටිමු.

ඔබට කලින් කල අවශ්‍ය වන්නා වූ ඕනෑම තොරතුරක් මා/අප ගෙන් විමසීමකින් තොරව ඔබට හෝ ඔබගේ නියෝජිතයෙකුට ලබා දීම සඳහා මාගේ/අපගේ බැංකුකරුවන්ට හෝ වෙනත් ප්‍රභවයන්ට මම/අපි මෙයින් බලය ලබා දෙන්නෙමි/දෙන්නෙමු. මාගේ/අපගේ ණය කාඩ්පත/පත් භාවිතා කළ යුත්තේ NDB බැංකුව මඟින් නිකුත් කර ඇති ණය කාඩ්පත් හිමියන්ගේ ගිවිසුමට, ඒටීඑම් සහ අනෙකුත් ගිණුම් වල නියමයන් හා කොන්දේසි වලට අනුකූලව පමණක් වන බවට මා/අප එකඟ වන අතර, NDB බැංකුව මඟින් නිකුත් කර ඇති ණය කාඩ්පත් හිමියන්ගේ ගිවිසුමෙහි නියමයන් හා කොන්දේසි වලට බැඳී සිටීමට මම/අපි තව දුරටත් එකඟ වෙමි/වෙමු. NDB බැංකුව විසින් නව ණය කාඩ්පත භාවිතා කිරීම සම්ප්‍රයෝජනය කරනුයේ මා/අප විසින් නියමයන් හා කොන්දේසිවලට අනුකූලතාවය දැක්වීමට අනුව බව මම/අපි පිළිගනිමි/පිළිගනිමු. මාගේ/අපගේ ණය කාඩ්පත් ගිණුමට කරන මුදල් තැන්පත් කිරීම් හෝ මාරුකිරීම් හෝ තාවකාලික සීමාවන් වැඩි කිරීම් මාගේ/අපගේ මුදල් අත්තිකාරම් සීමාවන් නොඉක්මවිය යුතු බව මම/අපි දනිමි/දනිමු. මගේ/අපගේ ණය කාඩ්පත/කාඩ්පත් ශ්‍රී ලංකාවේදී සහ ඉන් පිටතදී භාවිතා කිරීමේදී සමහර ATM යන්ත්‍ර/බැංකු සහ කවුළු සීමාවන් අදාළ විය හැකි බව මම/අපි දනිමි/දනිමු. මගේ/අපගේ අභිමතය පරිදි යොමු කිරීම් සිදුකළ නොහැකි නම් මට/අපට ලිපි ලැබෙන ලිපිනය NDB බැංකුව මඟින් වෙනස් කරනු ඇති බව මම/අපි දනිමි/දනිමු. විදේශයකදී වාණිජ ප්‍රමාණ වලින් ද්‍රව්‍ය මිලදී ගැනීමට සහ ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රාග්ධනය හුවමාරු කිරීමට මාගේ/ අපගේ ණය කාඩ්පත් භාවිතා නොකරන බවට මම/අපි එකඟ වන්නෙමි/වන්නෙමු. මා/අප සංක්‍රමණය වන්නේ නම් හෝ විදේශ රැකියාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත් වන්නේ නම් හෝ මාගේ/අපගේ ණය කාඩ්පත/කාඩ්පත් NDB බැංකුවට භාර දෙන බවට සහ සියලු හිඟ ගෙවීම් සම්පූර්ණයෙන් පියවන බවට මම/අපි සහතික වන්නෙමි/වන්නෙමු. මාගේ/අපගේ ඉල්ලීම පරිදි පළමු සහ අතිරේක කාඩ්පතක්/කාඩ්පත් නිකුත් කිරීමේදී දැරීමට සිදුවන සියලු අයකිරීම් වලට එකමුතුව සහ වෙන වෙනම වගකීමට මම/අපි එකඟ වෙමි/වෙමු. සිය ගනුදෙනුකරුවන් සමඟ තැපැල්පත්, ෆැක්ස් පණිවුඩ, ඊ-මේල්, විදුලි පණිවුඩ සහ කෙටිපණිවුඩ මඟින් සන්නිවේදනය කිරීමට NDB බැංකුවට හිමිකමක් ඇති බව මම/අපි පිළිගනිමි/ගනිමු. මෙම ඉල්ලුම් පත්‍රයෙහි ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි සහ සත්‍ය බවට මම/අපි ප්‍රතිඥා දෙමි/දෙමු. NDB බැංකුවේ පූර්ණ අභිමතය පරිදි ණය කාඩ්පත/පත් නිකුත් කරනු ලබන බව මම/අපි පිළිගනිමි/ගනිමු. විනිමය පාලන පනත යටතේ 2016 ජනවාරි මස 20 දිනැතිව නිකුත්කරන ලද අංක 1950/40 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව විදේශ විනිමය ගනුදෙනු සඳහා ණය කාඩ්පත/පත් භාවිතා කළයුතු ආකාරය පිළිබඳව පනවා ඇති කොන්දේසි ගැන මා/අප දැනුවත්ව සිටින අතර එකී කොන්දේසි වලට අනුකූලතාවය දැක්වීමට මම/අපි එකඟ වෙමි/වෙමු.

**අරමුදල් හුවමාරු කිරීමේ ඉලෙක්ට්‍රොනික කාඩ්පත් ඉල්ලුම්කරු/කරුවන් විසින් සිදුකළ යුතු ප්‍රකාශය**

විනිමය පාලකවරයා වෙත :

මා/අප.......................................................................................................

(පළමු කාඩ්පත් හිමියා/අතිරේක කාඩ්පත් හිමියා) ........................................................ ..................................................................................................(පළමු කාඩ්පත් හිමියා/ අතිරේක කාඩ්පත් හිමියා) මා/අප විසින් ඉහතින් සඳහන් කර ඇති සියලු විස්තර සත්‍ය සහ නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි/කරමු.

විනිමය පාලන පනත යටතේ 2016 ජනවාරි මස 20 දිනැතිව නිකුත් කරන ලද අංක 1950/40 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව විදේශ විනිමය ගනුදෙනු සඳහා ණය කාඩ්පත/පත් භාවිතා කළයුතු ආකාරය පිළිබඳව පනවා ඇති කොන්දේසි ගැන මා/අප දැනුවත්ව සිටින බව මෙයින් සනාථ කරන අතර මම/අපි එකී කොන්දේසි වලට අනුකූලතාවය දක්වන බවට මෙයින් සහතික වෙමි/වෙමු.

බැංකුව මගින් විනිමය පාලන පනතට අනුකූල අවශ්‍යතාවයන් සඳහා ලබාගත යුතු වන නිසා මට/අපට නිකුත් කර ඇති කාඩ් පතෙන්/පත්වලින් මා/අප සිදුකරන විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ ඕනෑම තොරතුරක් ලබා දීමට මම/අපි තවදුරටත් එකඟ වෙමි/වෙමු.

තවද, මා/අප සංක්‍රමණය වන්නේ නම් හෝ විදේශ රැකියාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත් වන්නේ නම් හෝ මාගේ/අපගේ ණය කාඩ්පත/කාඩ්පත්................................................ ....................................................................................... බැංකුවට භාර දීමට පියවර ගන්නා බවට මම/ අපි සහතික වන්නෙමි/වන්නෙමු.

මට/අපට නිකුත් කර ඇති අරමුදල් හුවමාරු කිරීමේ ඉලෙක්ට්‍රොනික කාඩ්පත (EFTC) මඟින් අවසර නොමැති විදේශ විනිමය ගනුදෙනු සිදුකළ බවට සැක කළ හැකි සාධාරණ සාධක තිබේනම් බලයලත් විදේශ මුදල් හුවමාරුකරු විසින් අරමුදල් හුවමාරු කිරීමේ ඉලෙක්ට්‍රොනික කාඩ්පත සඳහා මට/අපට විදේශ විනිමය නිකුත් කිරීම අත්හිටුවිය හැකි බව මම/අපි දනිමි/දනිමු.

මා/අප අත්සන/අත්සන් තැබීමට පෙර ණය කාඩ්පත් ඉල්ලුම් පත්‍රයේ සහ ඉහත සඳහන් ප්‍රකාශයේ සඳහන් තොරතුරු මම/ අපි කියවා තේරුම් ගතිමි/ ගතිමු.
ණය කාඩ්පතෙහි සහ ඉලෙක්ට්‍රෝනික ප්‍රකාශන පහසුකම් වල නියමයන් සහ කොන්දේසි කියවා තේරුම් ගත් බවට මම/අපි මෙයින් සනාථ කර සිටිමි/සිටිමු.

---------------------------------- පළමු කාඩ්පත් හිමියාගේ අත්සන

------------------------------------- අතිරේක කාඩ්පත් හිමියාගේ අත්සන

--------------------- දිනය :

## බැංකු නිලධාරියාගේ ප්‍රකාශය

.......................................................................................................................... වන මම ......................................................................................... විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සහ අදාළ ලේඛන සැලකිලිමත්ව පරීක්ෂා කළ අතර එම තොරතුරු සහ ලේඛන විනිමය පාලන අවශ්‍යතාවයන්ට සහ බැංකුවේ අභ්‍යන්තර පිළිවෙත් වලට අනුකූල වන බවට සෑහීමට පත්වෙමි. කාඩ්පත් හිමියා විසින් ඔහුගේ/ඇයගේ අරමුදල් හුවමාරු කිරීමේ ඉලෙක්ට්‍රොනික කාඩ්පත මඟින් සිදු කරන විදේශ විනිමය ගනුදෙනු කෙරෙහි යථා අවධානය යොමු කිරීමට බැංකුව කටයුතු කරන අතර කාඩ්පත් හිමියා විසින් ලබා දී ඇති ප්‍රතිඥාව කඩ කරමින් එකී අරමුදල් හුවමාරු කිරීමේ ඉලෙක්ට්‍රොනික කාඩ්පත මඟින් අවසර නොමැති විදේශ විනිමය ගනුදෙනු සිදුකළ බවට සැක කළ හැකි සාධාරණ සාධක තිබේ නම් විදේශ විනිමය ලබාදීම අත්හිටුවීමට කටයුතු කිරීමටත් එකී සිද්ධීන් විනිමය පාලකවරයාගේ අවධානයට යොමු කිරීමටත් බැංකුව පියවර ගන්නවා ඇත.

-------------------------------------------- බැංකු නිලධාරියාගේ අත්සන

---------------------- දිනය

වැඩි විස්තර සඳහා අපගේ පාරිභෝගික සේවාව අමතන්න. +94 11 244 8888

Version date: 09.03.2017

# NDB අතිරේක ක්‍රෙඩිට් කාඩ් අයදුම්පත



## සැමදා සතුට ඉතිරෙන ජීවිතයකට NDB ගුඩ් ලයිෆ් කාඩ්

සුපිරි දීමනා, සුවිශේෂී වාසි සමඟින් ඇදහිය නොහැකි ප්‍රතිලාභ ලබන්න.



The Good Life
Credit Card

T : 011 244 8888 www.ndbbank.com

නො. 40, නවම් මාවත, කොළඹ 02.

NDB බැංකුව
අපේ කැපවීම. ඔබේ ජයග්‍රහණයයි.

# සැපවත් දිවියකට, සාදරයෙන් පිළිගනිමු

NDB Good Life කාඩ්පත්, ඇදහිය නොහැකි දීමනා සහ වට්ටම් සමඟින් සුපිරි ප්‍රතිලාභ එකවර ලබාදෙන, ඔබේ ජීවිතය මින් පෙර නොවිඳි අයුරින් සැපවත්ව අත්විඳීමට අවස්ථාව සලසන එකම ක්‍රෙඩිට් කාඩ්පතයි. අඩු පොලී අනුපාත ලබාගැනීමේ සිට අලුත්ම දීමනා සහ වට්ටම් පළමුව හිමි කරගනිමින්, මාසික බිල්පතෙන් ඔබව නිදහස් කිරීම දක්වා සුපිරි ප්‍රතිලාභ NDB Good Life කාඩ්පතෙන් ලබාගෙන පහසුවෙන්, සුරක්ෂිතව සහ සැහැල්ලුවෙන් ඔබේ එදිනෙදා ජීවිතය සැපවත් කරගන්න, ඔබත් NDB Good Life කාඩ්පතක් ලබාගෙන සැපවත් දිවියක් දැන්ම අරඹන්න.

## දීමනා සහ වට්ටම් පළමුව හිමි කරගන්න.

සුපිරි වාසියක් පළමුවෙන්ම හිමිකරගන්න අකමැති කවුද? ඔබට NDB Good Life කාඩ්පතක් ඇත්නම් සුපිරි දීමනා සහ වට්ටම් හිමිකරගන්න වසරේ උත්සව සමය පැමිණෙන තුරු මග බලා සිටීමට අවශ්‍ය නැහැ. වෙනත් කිසිම කාඩ්පත් හිමියෙකුටත් වඩා ප්‍රථමයෙන් ඒ සියලු දීමනා වසර පුරාම ඔබට ලබා ගන්න පුළුවන්.

## හිතේ හැටියට වාරිකවලින් ගෙවන්න.

ඔබ සිහින මැවූ විවේකී නිවාඩුවට, දරුවාගේ උසස් අධ්‍යාපනයට, නැතිනම් ඔබ කැමතිම යමක් මිලදී ගන්නට මින්පසු එකවර ගෙවන්නට සිදුවීම ගැන අපහසුතාවට පත්වන්නට එපා. NDB Good Life කාඩ්පතෙන් ගෙවන්න. ඉන්පසු දුරකථනයෙන් NDB පාරිභෝගික සේවා අංශය අමතා ඔබට පහසු වාරික ගණන පවසන්න. පහසුවෙන්ම වාරික යටතේ ගෙවීම් සිදු කරන්න.

## ශේෂය මාරු කර අඩුවෙන් ගෙවන්න.*

ඔබ දැනට භාවිත කරන වෙනත් ඕනෑම බැංකුවක ක්‍රෙඩිට් කාඩ්පතෙහි ශේෂය NDB Good Life කාඩ්පතට මාරු කර ඉතා අඩු වාර්ෂික පොලී අනුපාතයක් යටතේ ගෙවීම් සිදුකරන්න. ශේෂය මාරු කර ගැනීම සඳහා ඔබ භාවිත කරන ක්‍රෙඩිට් කාඩ්පතෙහි අවසාන ගිණුම් ප්‍රකාශය ක්‍රෙඩිට් කාඩ් අයදුම්පතක් සමඟ ළඟම ඇති NDB ශාඛාවට ඉදිරිපත් කරන්න.

## මාසික බිල්පතෙන් නිදහස් වෙන්න.*

සුපිරි දීමනා සහ වට්ටම් පමණක්ම නොව, ඔබේ වියහියදම්වලට සහනයක් සලසන්නටත් NDB සූදානම්. වරින් වර පවත්වන දිනුම් ඇදීම්වලින් ජය ලබන වාසනාවන්තයාට ඔවුන්ගේ ප්‍රියතම වෙළෙඳසැලින් මිලදී ගැනීම් සිදුකළ බිල්පත Good Life ක්‍රෙඩිට් කාඩ් ගිණුම් ප්‍රකාශයෙන් කපාහරින්නෙ ඒ සහනය පාරිභෝගික ඔබට ලබාදෙන්නටයි.

## මොබයිල් බැන්කින්

නොමිලේ මොබයිල් බැන්කින් ඇප් එක මඟින් ඔබේ කාඩ්පත් ශේෂය පරීක්ෂා කිරීම, ගනුදෙනු පරීක්ෂා කිරීම, ගෙවීම් සිදුකිරීම, නැතිවූ කාඩ්පත් පිළිබඳ වාර්තා කිරීම, කාඩ්පත සක්‍රීය හෝ අක්‍රීය කිරීම, කාඩ්පත ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියා විරහිත කිරීම ආදී තවත් බොහෝ දේ කරගන්න.

## නොමිලේ විදේශ සංචාරක රක්ෂණාවරණය*

වැඩි විස්තර සඳහා www.ndbbank.com වෙබ් අඩවියට පිවිසෙන්න.

## නොමිලේ SMS ඇලට් සේවාව

ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා ඇති කාලීන ප්‍රවර්ධන වැඩසටහන් හා ගනුදෙනු සිදුකළ විට ඔබේ දුරකථනයට නොමිලේ SMS පණිවිඩ ලබාදීම.

## නොමිලේ විද්‍යුත් ගිණුම් වාර්තා
## e-statement (Interactive/Static)

## සිග්නේචර් සහ ඉන්ෆිනිට් ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන්ට ප්‍රමුඛතා සාමාජිකත්වය (Priority Pass Membership)*

* කොන්දේසි සහ නියමයන් අදාළ වේ.

A+(lka) Fitch Rating - නැෂනල් ඩිවලප්මන්ට් බෑන්ක් පී.එල්.සී., (PQ27)
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට ලක්වෙන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.

හඳුන්වාදෙන අය: සේ.අ.සා.අ. සාමාජික අංකය: ☐ බැංකු ශාඛා කේතය: ☐

# ණය කාඩ්පත් සඳහා අයදුම් පත්‍රය

කරුණාකර මෙම ඉල්ලුම් පත්‍රය නිවැරදිව සම්පූර්ණ කරන්න. ප්‍රමාණවත් නොවන තොරතුරු සහ අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිකම නිසා ඔබගේ ඉල්ලුම් පත්‍රය පිරිසැකසුම් කිරීම ප්‍රමාද විය හැකිය. එක් එක් ණය කාඩ්පතට ලබාදෙන ණය සීමාව NDB බැංකුවේ තනි අභිමතය පරිදි සිදුකෙරෙන අතර ඉල්ලුම්කරු හෝ වෙනත් පාර්ශ්වයක් විසින් ඒ පිළිබඳව පූර්ව නිගමනයන් සිදු කළ නොහැක.
කරුණාකර මෙම අයදුම් පත්‍රය පැහැදිලි අකුරෙන් සම්පූර්ණ කරන්න.

## මූලික කාඩ්පත් හිමියාගේ විස්තර

මූලික කාඩ්පත් හිමිහාගේ නම

ජාතික හැඳුනුම්පත් අංකය

දුරකථන අංකය: නිවස

ජංගම

## අතිරේක කාඩ්පත

කරුණාකර පහත නම් සඳහන් කර ඇති අයට අතිරේක කාඩ්පතක් නිකුත් කරන්න.
අතිරේක කාඩ්පත් ඉල්ලුම්කරු පවුලේ කිට්ටු සාමාජිකයෙකු විය යුතු අතර වයස අවුරුදු 18ට වැඩි විය යුතුය.

Title: පූජ්‍ය ☐ මයා ☐ මිය ☐ මෙනවිය ☐ ආචාර්ය ☐

වෙනත් (කරුණාකර නිවැරදිව සඳහන් කරන්න) ..............................

සම්පූර්ණ නම : (ජාතික හැඳුණුම්පතට අනුව)

කාඩ්පතෙහි මුද්‍රණය කළ යුතු නම (උපරිමය අකුරු 19කි)

අභිමත ණය සීමාව

ස්ත්‍රී/පුරුෂ භාවය

පුරුෂ ☐ ස්ත්‍රී ☐ උපන් දිනය d d m m y y y y

පුරවැසිභාවය

විදේශ ගමන් බලපත්‍ර අංකය

ජාතික හැඳුනුම්පත් අංකය

(ජාතික හැඳුනුම්පතෙහි හෝ විදේශ ගමන් බලපත්‍රයෙහි පිටපතක් කරුණාකර අමුණන්න)

ජාතික හැඳුනුම්පත් අංකය :
(පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් අලුත් ජා:හැ:ප: නිකුත් කර ඇත්නම්)

මවගේ විවාහයට පෙර නම

මුල් කාඩ්පත් හිමියන්ට ඇති සම්බන්ධතාවය

ස්ථිර ලිපිනය

ලිපි හුවමාරු ලිපිනය (ස්ථිර ලිපිනයෙන් වෙනස් වේ නම්)

දුරකථන අංකය

ජංගම දුරකථන අංකය

අයිතිකරු/ ව්‍යාපාරයේ නම

දෙපාර්තමේන්තුව

දුරකථන අංකය

## SMS කෙටි පණිවුඩ සේවාව

ඔබ ලබාදෙන දුරකථන අංකයට වෙළඳ ප්‍රවර්ධන හා සිදුකරණ ගනුදෙනු පිළිබඳව තොරතුරු SMS මගින් එවනු ලැබේ.

## ණය කාඩ්පත් බිල් ස්වයංක්‍රීයව පියවීම

NDB බැංකු ගිණුම් අංකය (NDB බැංකු ගිණුම් හිමියන්ට පමණි.)

පියවන ප්‍රමාණය ☐ මාසිකව 5%ක් හෝ ☐ 100%

## අවශ්‍ය ලිපිලේඛන

### අතිරේක කාඩ්පත්

- අතිරේක කාඩ්පත් හිමියාට ඇති ඥාති සම්බන්ධතාවය පිළිබඳ සාක්ෂි සනාථ කරන ලේඛනවල පිටපත්
  * විවාහ සහතිකය - කාලත්‍රයා
  * උප්පැන්න සහතිකය - දරුවෙකු/ මව්පියන්
  (පළමු කාඩ්පත් හිමියාගේ පෙළපත් නාමයට වඩා වෙනස් නම්)
- බිල් ගෙවීමේ සාක්ෂි
- අවශ්‍ය වුවහොත් අතිරේක විස්තර ඉල්ලා සිටිනු ඇත.

* ණය කාඩ්පත් ඇතුළු මුල්‍යමය වගකීම් හෙළි නොකිරීම නිසා ඉල්ලුම්කරු නුසුදුස්සෙකු සේ සැලකීමට බැංකුවට සිදුවනු ඇත.

### බිල් ගෙවීමේ සාක්ෂි

- පසුගිය මාසයේ උපයෝගිතා බිල්පතක පිටපතක් (දුරකථන- ස්ථිර ගෘහස්ථ)

සටහන: ජාතික හැඳුනුම්පතෙහි සඳහන් ලිපිනය හා මෙම ඉල්ලුම්පතෙහි සඳහන් ලිපිනය සමාන නම් පසු ගෙවුම් ජංගම දුරකථන බිල් පතක් බිල් ගෙවීමේ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.